# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2009 අංක 24 දරන පාහියන්ගල සංරක්ෂණ හා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 අප්‍රේල් මස 20 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 අප්‍රේල් මස 24 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 6.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

**2009 අංක 24 දරන පාහියන්ගල සංරක්ෂණ හා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2009 අප්‍රේල් මස 20 වන දින]

එල්. ඩී.— ඕ. අයි.එන්.සී. 22/2007.

**පාහියන්ගල සංරක්ෂණ හා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

"පාහියන්ගල සංරක්ෂණ හා සංවර්ධන පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක් එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී පදනමට සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා ඉටුකරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටුකර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති බැවින් ද එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2009 අංක 24 දරන පාහියන්ගල සංරක්ෂණ හා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට හා ඉන් පසු (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) පාහියන්ගල සංරක්ෂණ හා සංවර්ධන පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "පාහියන්ගල සංරක්ෂණ හා සංවර්ධන පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන්නේ ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. පාහියන්ගල සංරක්ෂණ හා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම.

2—PL 003096—2,750 (2008/07)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) පාහියන්ගල පූජා භූමිය තුළ වූ ඓතිහාසික ස්මාරක හා සංස්කෘතිකමය වස්තුන් සංරක්ෂණය කිරීම ;

(ආ) පාහියන්ගල පූජාභූමියේ පරිශ්‍රය තුල සියලුම ගොඩනැගිලි, විදුලිය, ජල සැපයුම හා සනීපාරක්ෂක සේවාවන් වැඩි දියුණු කිරීම සහ පවත්වාගෙන යාම ;

(ඇ) පාහියන්ගල පූජාභූමිය තුළ සිදු කෙරෙන ආගමික හා අධ්‍යාපනික පර්යේෂණයන්ට අවශ්‍ය සහාය දැක්වීම ; සහ

(ඈ) ශ්‍රී ලංකාවේ හා විදේශයන් හි වෙනත් බෞද්ධ සංවිධාන සහ ආගමික සංවිධාන සමග මිත්‍ර සම්බන්ධතා ඇතිකර ගැනීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව බැංකු ගිණුම් ආරම්භ කිරීම, පවත්වාගෙන යාම සහ ඒවා වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, දේශීය සහ විදේශීය ප්‍රභවයන්ගෙන් ලැබෙන ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීමේ හෝ එකතු කිරීමේ ද, ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ සහ සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගෙන යාම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයෙහි නියුක්ත කරවීමේ සහ ඔවුන් සේවයෙන් නෙරපීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ සියල්ල ම හෝ ඉන් කිසිවක් සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය සියලු ක්‍රියා කිරීමේ, ඉටුකිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම සඳහා මේ පනතේ 6 වන වගන්තිය යටතේ සාදනු ලැබූ රීතිවලට යටත් ව, සභාපතිවරයා, උප සභාපතිවරයා, ලේකම්වරයා, සහකාර ලේකම්වරයා, භාණ්ඩාගාරිකවරයා සහ තවත් සාමාජිකයන් දෙදෙනකුගෙන් සමන්විත වූ (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) භාරකාර මණ්ඩලයක් විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ ධුර දැරූ භාරකාර මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම මණ්ඩලය විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද, පාහියන්ගල විහාරයේ විහාරාධිපතීන් වහන්සේ මණ්ඩලයේ ප්‍රථම සභාපතිවරයා වන්නේ ය.

**6.** (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් පහත දැක්වෙන සියළු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් වර්ග කිරීම, ඔවුන් ඇතුලත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම ;

(ආ) නිලධාරීන් තෝරාපත් කර ගැනීම, ඔවුන් ධුරයෙන් ඉල්ලා අස්වීම, ධුර අත්හැරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඇ) සංස්ථාවේ මණ්ඩලය තෝරා පත්කර ගැනීම, ඔවුන්ගේ බලතල, කාර්යය සහ කර්තව්‍ය සහ ඔවුන්ගේ ධුර කාලය ;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, සේවකයන්ගේ සහ අනුයෝජිතයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) මණ්ඩලයේ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් පැවැත්විය යුතු වේලාව, ස්ථානය, එම රැස්වීම්වල දැන්වීම් සහ න්‍යාය පත්‍ර, ගනපූරණය සහ ඒ රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම ;

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) සංස්ථාව විසින් සාදනු ලබන රීති (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයෙන් ම සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් මේ වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

7. (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, පරිත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, සාමාජික මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් සංස්ථාව වෙනුවෙන් මෙතෙක් භාරගන්නා ලද හෝ මින් මතු භාරගනු ලබන සියලු මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන බැංකුවක හෝ බැංකු වැඩි ගණනක, සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සංස්ථාව විසින් කරන ලද වියදම් පියවීමට අවශ්‍ය මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

විගණනය සහ ගිණුම්

8. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබාගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු ව සිටින්නේ ද, එමෙන් ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

පදනම විසින් සහ පදනමට ගෙවිය යුතු ණය.

**9.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පදනමේ පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පදනමට ගෙවිය යුතු ණය, සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**10.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව සතු වන සියලු චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීමට හා දැරීමට නීතිය අනුව සංස්ථාවට හැකියාව හා බලය ඇති අතර, ඒ සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, 6 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති වලට යටත්ව සංස්ථාව විසින් මේ පනතේ කාර්යය සඳහා ඒ සියලු දේපළ දරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**11.** සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ සභාපතිවරයා, ලේකම්වරයා හෝ භාණ්ඩාගාරිකවරයා ඉදිරියේ මිස, කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තමන් පැමිණ සිටි බවට සළකුණක් වශයෙන් තම නම් අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු කළ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**12.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර වුව ද දේපළක් ඉතිරි වී තිබුණහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලැබ ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන කවරේ ද යන්න තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**13.** ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**14.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.